# චූටි කිටී



කථාව : ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

# හැඳින්වීම

කෘතියේ නම: චූටි කිටී

කතෘගේ නම: ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘ අයිතිය : (කථාව සහ සිතුවම්)

ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘගේ වෙනත් කෘති : පුංචි රුවනි,අවුරුදු කුමාරයා

ආඩම්බර හා පැංචා,අපූරු-

යාළුවෝ

කෘතිය පළ කල දිනය : 2025.02.08

**ISBN අංකය: 978-624-208-788-7**

# පිදුම

මෙම කථාපොත ලිවීමට මා හට උපකාර කල මාගේ

අම්මාටත් පවුලේ සියළු දෙනා හා මාගේ ගුරු

මව්වරුන්ටත්  ආදරයෙන් මෙම පොත පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය.

මාහට අකුරු කියාදුන් මාගේ ආදරණීය ගුරුතුමියන් වන රේනුකා ගුරුතුමියටත් මදාරා ගුරු හා මෙම අවස්ථාව මා හට ලබාදුන් මාගේ පාසලේ විදුහල්පතිතුමියට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

අපි ගමනක් ගිහින් එන කොට පාර අයිනේ ලස්සන පූස් පැටියෙක් හිටියා.මම පූස් පැටියා ළඟට කිට්ටු වුනා.

"ඇයි පැටියෝ මොකෝ ඔයා තනියම?''

"මට කවුරුත් නෑ ඉන්න ගෙදරකුත් නෑ''



“ම්ම්ම්....... එහෙමද? ඔයා කැමතියිද අපේ ගෙදර යන්න මාත් එක්ක? ’’පූස් පැටියා මන් දිහා ආදරයෙන් බලන් හිටියා.මම පූස් පැටියව වඩා ගත්තා....“ඔයා යන් අපේ ගෙදර කැමතියි නේද ඔයා...’’පූස් පැටියා ඔලුව වැනුවා.



“කෝ එන්න ඉතින් මගෙ අතට,ඔයා නම් හරිම හුරතල් පැටියෙක් තමයි.ඔයාගේ ඇඟ හරීම සිනිඳුයි...’’පූස් පැටියා ආදරයෙන් පුරු...පුරු ගෑවා.මන් එයාගේ ඔලුව අත ගෑවා.



අම්මේ.....අම්මේ......මට මේ පූස් පැටියා ගෙදර ගෙනියන්න ඕනී.අම්මා අපි ළඟට ආවා.හම්.....හම්..... හරි ඔයාගේ ආසාවනේ අපි ගෙනියමු.අම්මා පූස් පැටියා වඩා ගත්තා.එයා අතේ තිබුන රෙදි මල්ලක්ට පූස් පැටියව දා ගත්තා.



අපි ගෙදර ගිහින් අම්මා එක්ක පූස් පැටියා නෑව්වා.ඊට පස්සේ අම්මා රසම රස කිරි කොප්පයක් පැටියට දුන්නා.මට හරිම සතුටුයි.



“අම්මේ අපි කොහෙද මේ පැටියව තියන්නේ? අම්මා ලොකු පෙට්ටියක් ගෙනාවා.පරණ කොට්ටයක් දාලා රෙද්දක් දාලා එයාට ලස්සන ඇඳක් හැදුවා.මන් එයාට බොන්න පොල් කටුවකට වතුර තිබ්බා.වතුර බීලා පැටියා නින්දට ගියා.



මටත් හරිම මහන්සියි.මන් අම්මට තුරුල් වෙලා නිදා ගත්තා.උදේ නැගිටලා මන් පැටියා බලන්න ගියා.එයා රෙදි කෑල්ලේ නූලක් එක්ක සෙල්ලම් කරනවා.මන් එයාව එළියට අරන් පරණ පොඩි ප්ලාස්ටික් බෝලයක් දුන්නා.පැටියා ආසාවෙන් සෙල්ලම් කලා.මන් එයාගේ වැඩ අම්මටත් පෙන්නුවා දැන් ගෙදර හැමෝම එයාට කැමතියි.



එක් දවසක් මන් උදේ නැගිටලා පූස් පැටියව හෙව්වා එයා ගෙදර නෑ.මන් ගෙදර වටේම බැලුවා.මන් අඬාගෙන අම්මා ගාවට ගියා. “අම්මේ මගෙ පූස් පැටියා නෑ මට එයා ඕනි......’’අම්මා මන් දිහා බලන් හිටියා.

“පුතේ සත්තු හදන එක ලේසි නෑ.එයාලටත් නිදහසේ ඉන්න දෙන්න ඕනි’’අම්මා කිවුවා.



මම අම්මත් එක්ක පූස් පැටියා හැම තැනම හෙව්වා.ඒත් එයා නෑ මට හරිම දුකයි.ඔන්න ඉතින් ටිකක් දවල් උනා.අප්පච්චි ආවා.එයා ලොකු පෙට්ටියක් අම්මට දීල මොනවද කිවුවා.අම්මා මන් ළඟට ආවා.ආ මෙන්න අම්මා මට පෙට්ටිය දුන්නා.



මන් පෙට්ටිය ඇරියා....අනේ හරිම පුදුමයි මගේ පූස් පැටියා....“අප්පච්චී ඔයා මෙයාව කොහෙද අරන් ගියේ....”මම අප්පච්චිගෙන් ඇහුවා.“මම මේ පූස් පැටියව දොස්තර අංකල්ට පෙන්නුවා.”



“පූස් පැටියට අසනීප වෙන නිසා එයාට බෙහෙත් විද්දා...දැන් ඔයාට බය නැතුව සෙල්ලම් කරන්න පුළුවන්’’.“මගේ හොඳ අප්පච්චී’’ මන් අප්පච්චිගේ කරේ එල්ලුනා.අප්පච්චි මාව වඩා ගත්තා.අපි පූස් පැටියට නමක් දැම්මා.එයාගේ නම තමයි “බිංගෝ’’ අපේ ගෙදර සුරතලා තමයි බිංගෝ......



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්